# දැනගෙන පිදිය යුතු
# කඨින චීවරය

(ධර්ම දේශනාවක් ඇසුරිණි.)

පොකුණුවිට, ශ්‍රී විනයාලංකාරාරාම වාසී,
**පූජ්‍ය කුකුල්පනේ සුදස්සී ස්වාමීන් වහන්සේ**

අංක 444/8, මහරගම ලිපිනයේ පදිංචිව සිට
මීට තෙමසකට පෙර පරලෝ සැපත්
**පී.එම්. සෙනෙවිරත්න මහත්මියට**
පිං පිණිස දූ දරුවන් විසින්
මෙම ධර්ම ග්‍රන්ථය මුද්‍රණය කර
ධර්ම දානය පිණිස බෙදා දෙන ලදී.

බුː වː 2554 ක් වූ පොසොන් මස
ක්‍රිː වː 2010

**පූජ්‍ය කුකුල්පනේ සුදස්සී ස්වාමීන් වහන්සේගේ**
**වෙනත් ධර්ම ග්‍රන්ථ**

සංඝික දානයක් දෙන විට
බුද්ධ පූජාවේ යථාර්ථය
බුද්ධ ප්‍රතිමාව සහ බෞද්ධකම
ද්වේශය දුරු කරන්නේ කෙසේද(ධර්ම දේශනාවක් ඇසුරින්)
දානය පාරමිතාවක් වන්නට නම් (ධර්ම දේශනාවක් ඇසුරින්)
සිතේ සැබෑව (ධර්ම දේශනාවක් ඇසුරින්)
නොනිමෙන මරණයේ නොමියෙන අරුත් (ධර්ම දේශනාවක් ඇසුරින්)
නැණස වසන නීවරණ (ධර්ම දේශනාවක් ඇසුරින්)

**පරිගණක අක්‍ෂර සංයෝජනය**

මීමන සුසීම ස්වාමීන් වහන්සේ
පැල්පොල රාහුල ස්වාමීන් වහන්සේ

පිටකවර නිර්මාණය

Maya
සාලිය ජයකොඩි
ග්‍රැෆික්ස් හොරණ - දුර : 0602-300999

**මුද්‍රණය:**
**සිකුරු ප්‍රකාශකයෝ**
144, වෙනිවැල්කොළ,
පොල්ගස්ඕවිට.

දුරකථන : 2704152, 2704832

ශ්‍රද්ධාවන්ත පින්වතුනි,

මේ ශාසනයේ දක්වෙන පිංකම් අතර ''මහා" පිංකම් අටක් පිළිබඳව සඳහන් වෙනවා.

01. කඨින චීවර පූජාව.
02. අටපිරිකර පූජාව.
03. ආවාස පූජාව.
04. බුද්ධප්‍රමුඛ සංඝරත්නයට (සඟසතු කොට) දන්දීම.
05. දහම් පොත් ලිවීම.
06. කෙත්වතු පූජාව.
07. බුද්ධ ප්‍රතිමා ඉදි කිරීම.
08. වැසිකිළි සකසා පූජා කිරීම.

ඒ මහා පිංකම් අටයි. මේ අතර මුලින්ම සඳහන් වෙන කඨින චීවර පූජාව බෞද්ධයින් විසින් උත්සවාකාරයෙන් පවත්වන ප්‍රධානම පිංකමක්. මේ පිංකම හැමවිටම කරන්න බැහැ. භික්ෂූන් වහන්සේලා වස් පවාරණය කරන වප් (ඔක්තෝබර්) මාසෙ පුන් පොහෝ දින සිට ඉල් (නොවැම්බර්) මාසෙ පුන් පොහෝ දින දක්වා මාසය තුළ පමණයි කඨින චීවර පූජාව කරන්න ලැබෙන්නෙ. මේ කාලය ''චීවර මාසය" නමිනුත් හඳුන්වනවා.

කඨින චීවර පූජාව බොහෝ දෙනා උනන්දුවෙන් කළාට විවිධ හේතු නිසා ඒ කුශලය දුබල කරගන්නවා. ''කඨින" යන වචනයේ තේරුම ''තද , ශක්තිමත්" කියන එකයි. වචනාර්ථය අනුවම ශක්තිමත් කුශලයක් කරගන්න නම් පිංකමේ අනෙකුත් දේවල් වගේම තමන්ගේ මනසත් ශක්තිමත් කරගන්න ඕනෙ. නිවැරදිව මනස සකසා ගන්නවා නම් කඨින චීවරය පූජා කරන්න මූලික වන අයට පමණක් නෙවෙයි, පූජා කරන මොහොතේ දැකලා හිත පහදවා ගන්න හැම දෙනාටමත් අඩු නැතිව කුසලය සිදු කරගන්න පුළුවන්. ඒ වගේම කඨින චීවරය සමග සිවුරු පිරිකර, අෂ්ට පරිෂ්කාර, ආහාරපාන ඇතුළු ප්‍රයෝජන ගතහැකි සුළු දෙයක්

හෝ පූජා කරන සැම දෙනාටමත් නිවැරදිව සිත සකසා ගත්තොත් සැබවින්ම මහා පිංකමක් සිදුකරගන්න පුළුවන් වෙනවා.

ඕනෑම පිංකමක කුසලය මහත්ඵල මහානිසංස වෙන්නට කාරණා තුනක් ප්‍රධාන වශයෙන් හේතු වෙනවා. මොනවද ඒ කාරනා තුන?

- කරන්නා වූ පූජාවෙන් එය ලබන ප්‍රතිග්‍රාහකයාට කෙබඳු යහපතක් සිද්ධ වෙයිද, ඒ ප්‍රතිග්‍රාහකයාට සිද්ධ වෙන්නාවූ යහපතේ ප්‍රමාණයට ඒ කුසලය මහත් ඵල මහානිසංස වෙනවා.
- දෙවෙනි කාරණය තමයි දායකයාගේ සිත කොයිතරම් පවිත්‍රද, කොයි තරම් ප්‍රබලද, ඒ දායකයාගේ සිතුවිලි වල ප්‍රබල භාවය වැඩිවූ වැඩිවූ තරමට කරන්නා වූ කුසලය මහත්ඵල මහානිසංස වෙනවා.
- තුන්වෙනි කාරණය තමයි, පූජාව ලබන්නාවූ ප්‍රතිග්‍රාහකයන් වහන්සේගේ ගුණ සම්පත්තිය සීල සම්පත්තිය ආඪ්‍ය වූ තරමට, මානසික ශක්තිය වැඩි වැඩි වූ තරමට ඒ පිංකම කරන්නා වූ දායකයාට ලැබෙන ආනිසංසය මහත් වෙනවා.

මේ කරුණු තුන ප්‍රබල වූ තැනයි දානයක මහත්ඵල මහානිසංස භාවය දක්වන්නට පුළුවන්කම තිබෙන්නෙ. මේ කඨින චීවර පූජාව ශාසනයේ සඳහන් වෙන සියළු පිංකම් අතර මහා පිංකමයි කියලා සඳහන් වෙනවා. මේ පිංකම අන්‍ය සියළු පූජාවන් පරදවා මහා පිංකමක් වෙන්නෙ කුමක් නිසාද, මේ කරුණු තුන එහිදී කොයිතරම් සම්පූර්ණ වෙනවද කියලා අපි ටිකක් විමසා බලන්නට වටිනවා.

## පව් නසන ඇඳුම

අපි කඨින චීවරයට පළමුව චීවරයක් කියලා කියන්නේ මොකක්ද කියලා තේරුම් ගන්නට ඕනැ. සිවුරයි කියලා කියන්නේ කඩෙන් ගෙනාවා වූ සුදුසු වස්ත්‍රයකින් කඩ කපලා නිවැරදි දිග පළල අනුව තථාගතයන් වහන්සේ විසින් දේශනා කළාවූ විනය ප්‍රඥප්තීන්ට අනුකූලව සතරැස් ආකාරයෙන් මසා නිම කරගෙන



නිවැරදි පාට ඇතිවන හැටියට පඬු පොවලා ගන්ඨි යොදලා මේ ආදී වශයෙන් ක්‍රමානුකූලව අංග සම්පූර්ණව සකස්කර ගත්තාවූ භික්ෂූන් වහන්සේ නමකට කැපසරුප් වස්ත්‍රයට අපි චීවරයයි කියන නම ව්‍යවහාර කරනවා. එබඳු කැපසරුප් වස්ත්‍රයක් අපි සකසාගෙන යම් භික්ෂූන් වහන්සේ නමකට පූජා කළාම ඒ භික්ෂූන් වහන්සේට එතැන් පටන් ප්‍රයෝජන රාශියක් මේ චීවරය නිසා ලැබෙනවා. මේ ලෝකයේ කොතරම් පවු කම් කරමින් ජීවත් වන්නාවූ කෙනෙකු වුණත් ඒ පාප ධර්මයන්ගෙන් ඈත් කරලා චීවරයක් ගත දැවටුවොත්, එතැන් පටන් ඒ තැනැත්තා භික්ෂුවක් වශයෙන් වැඩෙනවා. ඒ භික්ෂූන් වහන්සේ ගිහියෙක් හැටියට ඉන්න කාලෙ කළාවූ පවුකම් වලින් ටිකෙන් ටික හෝ ඈත් වෙනවා. මිනී මරමරා හිටපු කෙනෙක් ඉන් ඉවත් කරලා මේ චීවරය ගත දැවටුවොත් එතැන් පටන් මිනී මැරීමෙන් අයින් වෙනවා. සොරකම් කරමින් හිටපු කෙනෙක් ඉන් ඉවත් කරලා මේ චීවරය ගත දැවටුවොත් ඉන් පසු සොරකම් කිරීමෙන් ඉවත් වෙනවා. අන්‍ය වූ පාප ධර්මයන්ගෙන් ටිකෙන් ටික ඈත් වෙලා යම් දවසක සියළු කෙලෙසුන් නසා අර්හත් භාවයට පැමිණෙන්නට උන්වහන්සේට මේ චීවරය උපකාර වෙනවා.

මේ තරම් මනුෂ්‍යයන්ට කෙලෙස් ප්‍රහාණය කරන්නට උපකාර වෙන වස්ත්‍රයක් තවත් නැහැ. ගිහි සමාජයේ සියළුම වස්ත්‍රාභරණ කෙලෙස් වඩවනවා. තෘෂ්ණාව වඩවනවා. ඊර්ෂ්‍යාව වඩවනවා. ආත්ම දෘෂ්ටිය වඩවනවා. මානය වඩවනවා. අනෙකා සතුව ලස්සන ඇඳුමක් තියෙනවා දකිනකොට ඊර්ෂ්‍යාව වැඩෙනවා. තමන්ටත් එවන් ඇඳුමක් ලබන්නට ඕනෑය කියලා තෘෂ්ණාව ඇතිවෙනවා. තමනුත් එවන් ඇඳුමක් ලැබූ තැනදී මාන්නය, සක්කාය දිට්ඨිය ඇතිවෙනවා. මේ ආදී වශයෙන් ගිහි සමාජයේ ඇඳුම් පැලඳුම් තෘෂ්ණා දෘෂ්ටි මාන කියන සියළු ක්ලේශ මූලයන් වඩවන්නාවූ සසර දිගු කරන්නා වූ අපායට මග පාදන්නාවූ ක්‍රමයකටයි පවතින්නේ. එබඳු ඇඳුම් අතර යම්කිසි ඇඳුමක් කෙලෙස් නසන්නට උපකාර වෙනවාද, තෘෂ්ණාව නසන්නට මානය නසන්නට සක්කාය දිට්ඨිය නසන්නට උපකාර වෙනවාද, මෙම චීවරය නම් වූ ඇඳුම පමණයි ඒ සඳහා උපකාර වෙන්නෙ.

මේ චීවරය ගත දරාගෙන එකවර සියළු කෙලෙසුන් නසා රහත් වෙන්නට සියළු දෙනාට බැරි වුණත්, ටිකෙන් ටික තම තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් ගුණදහම් පුරණවා.

## සැඟවී ඇති ගුණ මතු කරනවා

මේ පින්වතුන් අහලා ඇතිනෙ දහස් ගණනක් මිනිසුන් මරාපු අංගුලිමාල කුමාරයට බුදුහාමුදුරුවො කරුණු අවබෝධ කරලා මේ චීවරයක් ගත දවටලා පැවිදි කළා. මේ භික්ෂූන් වහන්සේ එතැන් පටන් තමන් සිද්ධ කළාවූ පාප ධර්මයන්ගේ සැබෑ ස්වභාවය මැනවින් වටහාගෙන ක්‍රමක්‍රමයෙන් සීලාදී ගුණ ධර්මයන් සම්පූර්ණ කළා. මෙසේ ගුණ පුරන්නාවූ අංගුලිමාල හාමුදුරුවෝ දවසක්දා පිඬුසිඟා වඩිද්දී දකිනවා ගර්භණී මාතාවක් දරු ප්‍රසූතිය පහසුවෙන් සිදු නොවී මහත් වූ වේදනාවෙන් පීඩා විඳිනවා. අර තරම් මිණී මරන්නට කුරිරු වූ හදවත මේ මවගේ දුක් විලාසය දැකලා අතිශයින් කම්පාවට පත්වුණා. බුදුහාමුදුරුවො හමුවෙන්නට ගිහිල්ලා අංගුලිමාල හාමුදුරුවො කියනවා ''ස්වාමීනී මා පිඬුසිඟා වඩිද්දී මාතාවක් දරු ප්‍රසූතිය ආසන්නව බොහෝ සේ පීඩාවෙන් වේදනා විඳිනවා". එතනදී තථාගතයන් වහන්සේ උපදෙස් දෙනවා ''එහෙමනං අංගුලිමාල ඔබ ගිහිල්ලා සත්‍යක්‍රියාවක් කරන්න. ඔබ මේ ජාතියේ උපන්දා පටන් දැන දැන සතෙක් මැරුවෙ නෑ කියලා ඔබ සත්‍යක්‍රියාවක් කරන්න. ඒ සත්‍යානුභාවයෙන් මවටත් දරුවාටත් යහපතක් පහසුවක් සිද්ධ වෙන්න කියලා". එතනදී අංගුලිමාල හාමුදුරුවො අහනවා ''ස්වාමීනි මම කොහොමද එහෙම කරන්නේ? මම මේ ජීවිතයේදීම දැන දැන මිනිසුන් දහස් ගණනක් මැරුවා. ඒ නිසා මම කොහොමද ඒ විදියෙ සත්‍යක්‍රියාවක් කරන්නෙ?" බුදුහාමුදුරුවො එතනදී පැහැදිලි කරනවා ''එහෙම නෙවෙයි අංගුලිමාල මම ඔබට කියන්නෙ, ඔබ මේ ආර්‍ය්‍ය ජාතියේ උපන්දා පටන් දැන දැන සතෙක් මැරුවෙ නෑ. ආර්‍ය්‍ය ජාතියේ උපන්නාය කියලා කිව්වේ මේ ආර්‍ය්‍ය ධර්මය පිළිගෙන මේ චීවරය පෙරවා ගත් දා පටන්. එතැන් පටන් ඒ තැනැත්තා ආර්‍ය්‍ය ශාසනයට ආර්‍ය්‍ය සමාජයට ආර්‍ය්‍ය ප්‍රතිපදාවට ඇතුල් වෙනවා. ඒ ආර්‍ය්‍ය ප්‍රතිපදාවට ඇතුල් වීම උත්පත්තියක් හා සමානයි. ඒ නිසා අංගුලිමාල ඔබ මේ ආර්‍ය්‍ය ජාතියේ උපන්දා පටන් කවදාවත් දැන දැන කුරා කුහුඹුවෙකු වත් මැරුවෙ නැහැ.



ඒ බව සිහි කරලා ඔබ සත්‍යක්‍රියා කරන්න."

එදා අංගුලිමාල හාමුදුරුවො ඒ මාතාව ළඟට ගිහිල්ලා සත්‍යක්‍රියා කරනවා ''නැගනියනි මම මේ ආර්‍ය්‍ය ජාතියේ උපන්දා ඉඳලා දැන දැන සතෙක් මැරුවෙ නෑ. ඒ සත්‍යානුභාවයෙන් ඔබටත් දරුවාටත් සුවයක් යහපතක් වේවා" කියලා. ඒ ස්වාමීන් වහන්සේගේ මුවින් පිට වුණාවූ සත්‍ය වචනයේ බලයෙන් අද දක්වා මේ සියළු මව්වරු යහපත ලබනවා. ප්‍රයෝජන ලබනවා. තවත් මේ සම්බුද්ධ ශාසනය පවතින තාක් සියළුම ස්ත්‍රී වර්ගයාට, සියළුම මව් වරුන්ට යහපත පිණිස ඒ මුවින් පිට වුණාවූ වචනය හේතු වෙනවා. ඒ කුමන ආශ්චර්‍ය්‍යක්ද පින්වතුනි? මේ චීවරයෙ බලයයි. අර තරම් දරුණු සිතක් මොලොක් කරලා තව කෙනෙකුගේ දුක පීඩාව හඳුනන කාරුණික මෛත්‍රී සහගත තත්වයට පත් කරන්නට පුළුවන් වුණේ මේ චීවරයේ බලය නිසයි.

මේ ආකාරයෙන් යම්කිසි කෙනෙක් මේ චීවරය හඳිනවාද පෙරවනවාද එතැන් පටන් ඒ තැනැත්තා ටිකෙන් ටික පව්කම් වලින් ඈත් වෙනවා පමණක් නොවෙයි ගුණධර්ම වලට නැඹුරු වෙනවා. මේ මහා යහපත කරන්නට පුළුවන් අන්‍ය දානයක් මේ ලෝකයේ තවත් නෑ ධර්ම දානය හැරුණු කොට. ධර්ම දානය හැරුණු කොට ආමිස දානයන් අතුරින් මේ චීවරයට පමණයි සවිය තියෙන්නෙ බලය තියෙන්නෙ තව කෙනෙක් ගුණාත්මක භාවයෙන් පෝෂණය කරන්න. ආහාරයක් පූජා කළොත් එය දින කීපයකින් ක්ෂය වී විනාශ වී යනවා. ආවාසයක් හදලා පූජා කළොත් එය වසර කිහිපයකින් ක්ෂය වී විනාශ වී යනවා. අන්‍ය ඕනෑම දෙයක් පූජා කළත් එය කලකට පමණයි ප්‍රයෝජනවත් වෙන්නෙ. නමුත් චීවරයක් පූජා කළොත් ඒ චීවරය නිසා අති දීර්ඝ වූ මේ සසර ගමන කෙටි කර ගන්නට, අනන්ත සංසාරයක දුක් විඳින්නට හේතුවන පාප ධර්මයන්ගෙන් ඉවත් වෙන්නට, ගුණධර්මයන් වඩවන්නට, සියළු කෙලෙසුන් නසා අර්හත්වයට පැමිණෙන්නට, මේ පූජා කරන්නාවූ චීවරය ඒකාන්තයෙන් උපකාර වෙනවා.

## අර්හත් ධජය!

මේ ආකාරයෙන් පුද්ගලයෙක් ආර්ය භාවයට, රහත් භාවයට පමුණුවන්නට මේ වස්ත්‍රය හේතු වන නිසා මේ සිවුරට ''අර්හත් ධජය'' යයි කියනවා. බුදු පසේබුදු මහරහතන් වහන්සේලා යම්තාක් ලෝකයේ පහළ වුණා නම් ඒ සියළු උතුමන් වහන්සේලා ගත දරූ නිසාත් මේ චීවරයට අර්හත් ධජයයි කියලා කියනවා. මේ විදිහට අර්හත් ඵලය සාක්ෂාත් කරගත් උතුමන් විසින් දරූ නිසත්, අර්හත් ඵලය සාක්ෂාත් කරගන්නට උපකාර වන නිසත් කියන මේ දෙයාකාර අර්ථයෙන් අර්හත් ධජ සංඛ්‍යාත වූ ශ්‍රේෂ්ඨ චීවරයකුයි අපි මේ පූජා කරන්නෙ කියලා සිත පහදවා ගන්නට ඕනෙ. ඒ නිසා පෙර උතුමන් සඳහන් කළා,

**''පන්ථෙ දිස්වාන කාසාවං - ඡඩ්ඩිතං මිල්හ මක්ඛිතං**
**සිරස්මිං අඤ්ජලිං කත්වා - වන්දිතබ්බං ඉසිද්ධජං ''**

පාරේ අයිනක කාණුවක කුණු මඩ තැවරිලා, අසුචි තැවරිලා හෝ යම් සිවුරක් තියෙනවා නම් එයට පවා දොහොත් මුදුන් තබා වඳින්නට වටිනවා. ඒ කුමක් නිසාද, මේ අර්හත් ධජයයි කියලා. ඒ තරම් ගරු සම්භාවනීය ශ්‍රේෂ්ඨ ඇඳුමකුයි, පව් නසන්නට හේතු වන කුසල් වඩන්නට හේතුවන ශ්‍රේෂ්ඨ ඇඳුමකුයි මේ චීවරය කියන්නේ. එබඳු චීවරයකුයි අපි මේ පූජා කරන්නේ කියලා සිත පහදවා ගන්නට ඕනෙ. මේ විදියට චීවරයක් ලබන්නාවූ ප්‍රතිග්‍රාහකයන් වහන්සේට එයින් ලැබෙන්නාවූ පළමුවෙනි ප්‍රයෝජනය තමයි සියළු සාංසාරික  දුක් වලින් නිදහස් වෙලා නිවන් අවබෝධ කරගන්නට මනස යොමු වීම. මේ උපකාරය මේ යහපත අන්‍ය කිසිම පූජාවකින් සිද්ධ කරන්න පුළුවන් කමක් නෑ. ඒ නිසා පූජාවකින් ප්‍රතිග්‍රාහකයින් වහන්සේට ලැබිය යුතු අග්‍රම ඵලය මේ චීවර පූජාව තුළින් ලැබෙනවා.

## බාහිර ආරක්ෂාව

ඊළඟට දෙවෙනි ප්‍රයෝජනය තමයි භික්ෂූන් වහන්සේ නමකට මේ සිවුර පරිහරණය කරන්නට බුදුහාමුදුරුවො පැනෙව්වෙ බාහිර උවදුරු වලින් ආරක්ෂා වෙන්න.

**''සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය ඩංස මකස වාතාතප සිරිංසප සම්පස්සානං පටිඝාතාය........''**



මේ සිවුර පෙරවිය යුත්තේ සීතලෙන් වලකින්නට, උෂ්ණයෙන් වලකින්නට, මැසි මදුරුවන්ගෙන් ආරක්ෂා වෙන්නට, ගෝනුසු පත්තෑ ආදී සර්පයින්ගෙන් ආරක්ෂා වෙලා සුවසේ ගුණධර්ම පුරන්නට. බාහිර බොහෝ උපද්‍රවයන්ගෙන් ආක්ෂා වෙන්නට තථාගතයන් වහන්සේ මේ සිවුරයි පැනෙව්වෙ. ගිහි සමාජයේ බොහෝ මනුෂ්‍යයන්ට සීතලට එක් ඇඳුමක් උණුසුමට තවත් ඇඳුමක් ආදී වශයෙන් විවිධ අවශ්‍යතාවලට විවිධ ඇඳුම් ආයිත්තම් තියෙනවා. නමුත් මේ පැවිදි සමාජයට බුදුහාමුදුරුවො මේ සියළු කාර්යයන් සඳහා පැනෙව්වෙ තුන් සිවුරක් පමණයි. අඳනය, තනිපට සිවුර සහ දෙපට සිවුර. ඒ නිසා කෙලෙස් නසන්නට, මනසේ ආරක්ෂාව පිණිස මේ චීවරය උපකාර වෙනවා වගේම භික්ෂූන් වහන්සේ නමකට මේ සිවුර හාත්පසින්ම එන බොහෝ උපද්‍රවයන්ගෙන් කය ආරක්ෂා කරගෙන සුවසේ ගුණධර්ම පුරන්නට ඒකාන්තයෙන් උපකාර වෙනවා. එය භික්ෂූන් වහන්සේ නමකට සිවුර නිසා ලැබෙන්නාවූ දෙවෙනි ප්‍රයෝජනයයි.

## ගරුබුහුමන් හා ප්‍රත්‍ය ලාභ

ඊළඟට තුන්වෙනි ප්‍රයෝජනය තමයි මේ චීවරය ගත දරාගත් දා පටන් දෙවියන්ගේ මිනිසුන්ගේ බඹුන්ගේ ගරු බුහුමනට වන්දනා මානයට පාත්‍ර වෙනවා භික්ෂූන් වහන්සේ නමක්. ගිහි පුද්ගලයෙක් කොයි තරම් ගුණාත්මක භාවයෙන් දියුණු වුණත් කොයිතරම් සිල්වත් භාවයෙන් දියුණු වුණත් ඒ සීලය ගුණය දන්නා අයෙක් විනා ගිහියෙකුට නමස්කාර කරන්න පෙලඹෙන්නේ නෑ. නමුත් භික්ෂූන් වහන්සේ නමකට සීලාදී ගුණධර්මයන්ගෙන් අඩුපාඩුකම් තිබුණත් මේ චීවරය දරාගෙන සිටීමේ ශ්‍රේෂ්ඨ භාවය නිසාම උන්වහන්සේ අන් අයගේ වන්දනාවට ලක්වෙනවා, පූජාවට ලක්වෙනවා. සීලය සහ ගුණයත් තියෙනවා නම් සියළු මිනිසුන්ගේ සියළු දෙවියන්ගේ සියළු බ්‍රහ්මයින්ගේ වැඳුම් පිදුම් ලබනවා. ඒ වගේම අවශ්‍ය ඕනෑම අවස්ථාවක දී ආහාරපාන ටික ළඟට ගෙනවිත් දෝතින්ම පූජා කරලා වැඳ නමස්කාර කරනවා. ගිහි සමාජයේ අය දිවාරාත්‍රී වෙහෙසෙනවා කුසගින්නට ආහාර ටිකක් සොයාගන්න. මේ චීවරය  දරාගත් භික්ෂූන් වහන්සේලාට මේ චීවරයේ බලය නිසා ආහාර ටික තමන් ළඟටම ලැබෙනවා. ඒ

වගේම ඉන්න හිටින්න ගොඩනැගිලි ගෙවල්දොරවල් හදා ගන්න ගිහි මනුෂ්‍යයො ජීවිත කාලයම වෙහෙසෙනවා. ලක්ෂ ගණන් මුදල් වැය කරන්න සිදුවන නිසා දහඩිය මහන්සියෙන් හම්බ කරනවා. ඒ තරම් වෙහෙසක් මහන්සියක් නැතිව භික්ෂූන් වහන්සේ නමකට සියළු ආවාස පහසුකම් මහජනයා විසින් ශ්‍රද්ධාවෙන් ගෞරවයෙන් සකස් කරලා දෙනවා. මේ කුමන ආශ්වර්යයක්ද? සිවුරක් ගත දරාගෙන සිටීමේ ආශ්වර්යයයි.

මේ විදියට මනුෂ්‍යකුට ජීවත්වෙන්න අවශ්‍ය චීවර පිණ්ඩපාත සේනාසන ගිලන්පස කියන මේ සිව්පසයම නොඅඩුව ලබන්නට පුළුවන් භාග්‍ය වාසනාව භික්ෂූන් වහන්සේ නමකට හිමිවෙන්නෙ මේ චීවරය දරාගෙන සිටීමේ හේතුව නිසයි පින්වතුනි. මේ චීවරය දරාගත් දා පටන් සියළුම මනුෂ්‍යයින්ගේ වැඳුම් පිදුම් පූජා සත්කාර නොමදව ලැබෙනවා වගේම ගිහියෙකුට වඩා හාත්පසින්ම පරිවාර සම්පත්තියත් ලැබෙනවා. මේ කියන සියළු යහපත උදාවෙන්නේ මේ සිවුර නිසයි. ඒ නිසා චීවරයක් පූජා කිරීමෙන් එය පරිහරණය කරන්නාවූ භික්ෂූන් වහන්සේට ලැබෙන තුන්වෙනි ප්‍රයෝජනය තමයි සියලු දෙනාගේ ගරුබුහුමන් සත්කාර හා පරිවාර සම්පත්තිය නොමදව ලැබීම.

## බැඳීම් වලින් නිදහස්

ඒ වගේම මේ චීවරය ලබන්නාවූ භික්ෂූන් වහන්සේට හතරවැනිව ලැබෙන ප්‍රයෝජනය, යහපත තමයි බන්ධන වලින් නිදහස්වීම. ගිහි සමාජයේ කෙනෙකුන්ට ගුණධර්ම පුරන්නට කොතෙක් ඕනෑකම තිබුණත් නිදහසේ ගුණධර්ම පුරන්න ඉඩක් නෑ. බිරිඳ වෙනුවෙන් කරන්නට තියෙන යුතුකම්, සැමියා වෙනුවෙන් කරන්නට තියෙන යුතුකම්, දරුවන් වෙනුවෙන් මව්පියන් වෙනුවෙන් ඤාතීන් වෙනුවෙන් සමාජය වෙනුවෙන් දහසකුත් එකක් වගකීම් නැමති බන්ධනයන්ගෙන් දස අතින් බැඳිලා. ඒ බන්ධනයන්ගෙන් බැඳී තිබෙන නිසා ගුණ ධර්ම පුරන්නට හුදකලා වෙන්නට නිස්කලංක වෙන්නට උත්සාහ කළත් ගිහි මනුෂ්‍යයන්ට බොහෝ සම්බාධක පැමිණෙනවා. නමුත් ගිහි වස්ත්‍ර ඉවත් කරලා මේ චීවරය ගත දරාගත් දා පටන්



ඒ භික්ෂූන් වහන්සේ සකලවිධ සමාජ බන්ධනයන්ගෙන් නිදහස් වෙනවා. බිරිඳක් වෙනුවෙන් කරන්නට යුතුකම් ඉතිරි වෙන්නේ නෑ. සැමියෙක් වෙනුවෙන් කරන්නට යුතුකමක් ඉතිරි වෙන්නේ නෑ. දරු මුණුබුරන් වෙනුවෙන් ඤාතීන් වෙනුවෙන් හිතවතුන් වෙනුවෙන් සමාජය වෙනුවෙන් කියලා කිසිම බන්ධනයක් නැතිව සියළු සමාජ බන්ධනයන්ගෙන් නිදහස් වෙනවා.

එහෙත් තථාගතයන් වහන්සේ දේශනා කළා මවුපියන් වෙනුවෙන් කරුණාවෙන් මෛත්‍රියෙන් අනුග්‍රහ දැක්විය යුතුයි. තමන්ට ඇප උපස්ථාන කරන්නාවූ දායකයින් වෙනුවෙන් කරුණාවෙන් මෛත්‍රියෙන් සංග්‍රහ කළ යුතුයි. ඒ සංග්‍රහ කරන්නේ ඤාතීන්ට ඤාති සංග්‍රහයක් කරන්නා වගේ බැඳීමෙන් නොවේ. මේ මනුෂ්‍යයෝ මට ගුණධර්ම පුරාගන්නට, නිවන් මග දියුණුකර ගන්නට උපකාර කරන සත්පුරුෂ පිරිසක්, ඒ නිසා මේ අයට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කළ යුතුයි කියන කාරුණික සිතින් යම් සංග්‍රහයක් කරනවා විනා ඉන් එහාට කිසියම්ම බන්ධනයක් එතන පවතින්නේ නෑ. මෙ විදියට සියළුම සමාජ බන්ධනයන්ගෙන් නිදහස් වෙලා හුදකලාව නිවන් මගට අවශ්‍ය ගුණධර්ම පිරීමේ වාසනාව භාග්‍යය චීවරයක් දරන ස්වාමීන් වහන්සේ කෙනෙකුට ලැබෙනවා.

## කඨින චීවරය

මේ කිව්වේ සාමාන්‍ය සිවුරකින් ලැබෙන්නාවූ ආනිසංස. නමුත් අපි මේ පූජා කරන්නේ සාමාන්‍ය සිවුරක් නෙවෙයි, කඨින චීවරයක්. කඨින චීවරය පිළිබඳව දහමෙ සඳහන් වෙන්නෙ මෙහෙමයි.

**''ගිරිරාජ සමං රාසිං - සංඝේ දේති තිචීවරං**
**ඒකස්ස කඨින දානස්ස - කලං නාග්ඝති සෝළසිං''**

මහාමේරු පර්වතය දක්වා උසට තුන් සිවුරු පූජා කළත් - තුන් සිවුරු කිව්වෙ තනිපට සිවුර දෙපට සිවුර අඳන සිවුර - එබඳු සිවුරු සකසලා මහාමේරු පර්වතය හා සමානව උසට පූජා කළත්, මේ කඨින චීවර පූජාවකින් ලැබෙන්නාවූ ආනිසංසය දාසයට

බෙදලා එය නැවතත් දාසයට බෙදුවම ලැබෙන්නාවූ ඉතා අල්ප ආනිසංසයටවත් සමාන කරන්නට බෑ. තවත් තෝරා ගන්නට පහසු ආකාරයෙන් කියනවා නම් දාසය නැවත දාසයෙන් වැඩි කළාම 256 යි. මහාමේරු පර්වතය තරම් උසට තුන්සිවුරු එක්වරක් පුදනවා දෙවරක් පුදනවා තෙවරක් පුදනවා මේ ආකාරනේ 256 වාරයක් පිදුවත්, එක් කඨින චීවරයක් පූජා කරන කුසලයට සමාන කරන්න බැහැ කියන එකයි එම ගාථාවේ තේරුම.

කඨින චීවරයක් පූජා කිරීමෙන් මෙතරම් ආනිසංස ලැබෙන්නේ කොහොමද කියලා අපි විමසලා බලන්න ඕනෙ පින්වතුනි. අර මා මුලින් චීවරය පිළිබඳව කියන ලද ප්‍රයෝජන හතරම කඨින චීවරයෙනුත් ලැබෙනවා. ඊට අමතරව මේ කඨින චීවරයක් ලැබුවා වූ භික්ෂූන් වහන්සේ කෙනෙකුට බුදුහාමුදුරුවො නිදහස දුන්නා උන්වහන්සේ පැනෙව්වා වූ ශික්ෂා පද පහකින් නිදහස්ව සුවසේ පවතින්නට. ඒ නිදහස දුන්නේ අයාලේ යන්නට නොවේ. සුවසේ ගුණධර්ම පුරන්නටයි. චීවර මාසය ආරම්භ වන්නේ වප් මාසයේ පසලොස්වක පොහොය දවසේ ඉඳලයි. ඒ නිසා වප් මාසයේ පසලොස්වක දවසේ ඉඳලා මැදින් මාසෙ පසලොස්වක පොහොය දවස දක්වා මේ අතර මාස පහක් මුළුල්ලේ කඨින චීවරයක් ලැබූ භික්ෂුවකට මේ ශික්ෂාපද පහකින් නිදහස ලැබෙනවා . මොනවද ඒ ශික්ෂාපද,

''අත්ථත කඨිනානං වෝ භික්ඛවේ පඤ්ච කප්පිස්සන්ති, අනාමන්තචාරෝ අසමාදාන චාරෝ ඝනභෝජනං යාවදත්ත චීවරං යෝච තත්ථ චීවරුප්පාදෝ සෝ නේසං භවිස්සති."

## භික්ෂූන්ට ආනිසංස පහක්

බුදුහාමුදුරුවො දේශනා කළා ''මහණෙනි කඨිනයක් පිළිගත්තා වූ, කඨිනයක් ඇතුරුවා වූ භික්ෂූන් වහන්සේට කරුණු පහක් කැප වෙනවා. ආනිසංස පහක් ලැබෙනවා. ඒ කුමන ආනිසංස පහක්ද ?"

### ''අනාමන්ත චාරෝ"

භික්ෂූන් වහන්සේ නමක් තමන් ඉන්න ආවාසයෙන් පිට වෙලා යනවා නම් අඩු තරමින් එතන ඉන්න ආවතේව කරන



කෙනෙකුට හෝ කියලා මිසක් පිට වෙන්නට බෑ. එසේ නොකියා පිටවෙලා ගියොත් ඇවතක් සිදුවෙනවා. නමුත් මේ කඨින චීවරය ලැබූ භික්ෂූන් වහන්සේ නමකට යම්කිසි ධර්ම චර්යාවක් සඳහා, යහපත් කටයුත්තක් සඳහා ඕන මොහොතක ඕනෑම වෙලාවක කිසිවෙකුට නොදන්වා විහාරයෙන් බැහැරවීමේ අයිතිය තථාගතයන් වහන්සේ විසින් පවරලා තියෙනවා. විශේෂයෙන් මේ නිදහස ධූතංගධාරී භික්ෂූන් වහන්සේලාට ප්‍රයෝජනවත් වෙනවා. ඒ පළවෙනි ආනිසංසය මේ කඨින චීවරය ලැබූ භික්ෂුවකට ලැබෙන.

### දෙවැනි ආනිසංසය ''අසමාදාන චාරෝ"

අසමාදාන චාරෝ කියලා කිව්වෙ තුන්සිවුරු අධිෂ්ඨාන කළාවූ භික්ෂුවකට සෑම දාම පසුවදා අරුණ නැගෙන කොට, ඉර පායන කොට සිවුරු තුනම ළඟ තියෙන්නට ඕන. එකක් හෝ වෙන තැනක තිබුණොත් ඇවතක් සිද්ධ වෙනවා. වරදක් කළා වෙනවා. මේ කඨින චීවරය පිළිගත්තාවූ භික්ෂුවකට කැමති සිවුරක් ළඟ තියාගන්න පුළුවන්, කැමති සිවුරක් බැහැර තියන්න පුළුවන්. සුවසේ පහසුවෙන් ගුණධර්ම පුරන්න පුළුවන් මේ කියන ලද මාස පහේ කාලය ඇතුළත. මේ කඨින චීවරයක් ලැබූ භික්ෂුවකට දෙවනුව ලැබෙන්නාවූ ආනිසංසයයි.

### තෙවැනි ආනිසංසය ''ඝන භෝජනං"

අතීත කාලයේ සමහර මනුෂ්‍යයෝ භික්ෂූන් වහන්සේලා දෙතුන් නමක් වැඩ සිටින තැනට ගිහින්, ආරාධනා කරනවා, ස්වාමීනි අපේ ගෙදර අද බතක් ලෑස්තිකරලා තියෙනවා, කෑමක් ලෑස්තිකරලා තියෙනවා, අපේ ගෙදර භෝජන සංග්‍රහයක් ලෑස්තිකරලා තියෙනවා කියලා නුසුදුසු ආකාරයෙන් ආරාධනා කරනවා. එබඳු නුසුදුසු ආකාරයේ ආරාධනා පිළිගන්නට එපා කියලා බුදුහාමුදුරුවො දේශනා කළා. නමුත් මේ කඨින චීවරයක් ලැබුවාවූ භික්ෂුවකට කොයි විදියෙන් ආරාධනා කළත් දායකයාට අනුග්‍රහ පිණිසත් තමන්ගේ මෙලොව පරලොව අභිවෘද්ධිය පිණිසත් ඒ ඕනෑම ආරාධනාවක් පිළි ගෙන දන් වළඳන්නට බුදුහාමුදුරුවො නිදහස දුන්නා. මේ කඨින චීවරයක් පිළිගන්නා වූ භික්ෂුවකට

තුන්වෙනුව ලැබෙන ආනිසංසයයි.

**සිව්වැනි ආනිසංසය ''යාවදත්ත චීවරං "**

උපසම්පදා භික්ෂූන් වහන්සේ නමක් තුන් සිවුරක් අධිෂ්ඨාන කරගෙන පරිහරණය කරනවා නම් ඒ සිවුරු තුනට අමතරව කිසිම වස්ත්‍රයක් විනයානුකූල ක්‍රමයකට හැරෙන්නට තියාගන්න බෑ. එහෙම තියා ගත්තොත් ඇවතක් සිද්ධ වෙනවා. නමුත් මේ කඨින චීවරයක් පිළිගත්තාවූ භික්ෂුවකට තමන්වහන්සේ කැමති තාක් සිවුරු පිරිකර මේ මාස පහ ඇතුළත පරිහරණය කරන්න පුළුවන්, අන් අයට දෙන්න පුළුවන්, කැමති සේ පවත්වන්න පුළුවන්. මේ කඨින චීවරයක් පිළිගත්තාවූ භික්ෂුවට හතරවෙනුව ලැබෙන ආනිසංසයයි.

**පස්වැනි ආනිසංසය ''යෝච තත්ථ චීවරුප්පාදෝ සෝ නේසං භවිස්සති"**

අන්‍ය අවස්ථාවලදී සඟ සතු කරලා යම් තාක් සිවුරු පිරිකර පූජා කරනවද, ඒවා එක් භික්ෂුවකට ගන්න බෑ, සියළු දෙනාට බෙදා දෙන්න ඕන. නමුත් මේ කඨිනයක් පිළිගත්තාවූ භික්ෂුවට ඒ හා සමඟ සඟසතු කරලා ලැබෙන සිවුරු සියල්ලමත් කඨිනානිසංස පවතින මාස පහ ඇතුලත ලැබෙන සිවුරු සියල්ලමත් තමන්ට කැමැත්තක් කරන්න පුළුවන්. ඕන නම් අන් අයට දෙන්න පුළුවන්. ඕන නම් පූජා කරන්න පුළුවන්. ඕන නම් පරිහරණය කරන්න පුළුවන්. තමන්ගෙ කැමැත්තට අනුව පවත්වන්න පුළුවන්. මේ කියන ශික්ෂාපද පහකින් බුදුහාමුදුරුවො නිදහස දුන්නා කඨින චීවරයක් ලබන්නාවූ භික්ෂුවට.

## අතිරේක ගුණයන්ට යොමු වෙනවා

සිවුරක් ලැබීමෙන් මුලින් දක්වූ ආනිසංස හතරක් ලැබෙනවා. කඨින චීවරයක් නිසා මේකෙන් තවත් ආනිසංස පහක් ලැබෙනවා, බුදුහාමුදුරුවො පැනෙව්වාවූ ශික්ෂා පද වලින් නිදහස්වීමෙන්. තවත් එක් ආනිසංසයක් කඨින චීවරය නිසා ලැබෙනවා. ඒ මොකක්ද? සාමාන්‍ය චීවරයක් දරාගෙන සිටිනවාට වඩා, මම මේ පරිහරණය කරන්නේ කඨින චීවරයක් කියන සිතුවිල්ල මතුවෙන වාරයක් පාසා ඒ භික්ෂූන් වහන්සේ



අතිරේකව ගුණධර්ම පුරන්නට යොමු වෙනවා. ඒ වගේම සාමාන්‍ය කෙනෙකුට කඨින චීවරයක් පිළිගන්නට බැහැ. තුන් මාසයක් වස් වසලා අතිරේක ශික්ෂාපද සමූහයකට අනුගතවෙලා, ඒ වස් කාලය තුළ බුදුහාමුදුරුවො පැනෙව්වා වූ ආකාරයට ගුණධර්ම පිරූ භික්ෂූන් වහන්සේ නමකට පමණයි කඨින චීවරයක් පිළිග න්න පුළුවන්. ඒ නිසා සාමාන්‍ය චීවරයකට වඩා වැඩි වැඩියෙන් ගුණධර්ම පුරන්නට නැඹුරු වෙනවා. මේ අයුරින් ලබන කෙනාට ආනිසංස දහයක්, ප්‍රයෝජන දහයක් ලැබෙන මහා පූජාවකුයි අපි මේ සිද්ධ කරන්නේ කියලා සිත පහදවාගන්න ඕන.

දැන් මම මෙතෙක් වේලා පැහැදිලි කළේ එක් කාරණයක්. මොකක්ද ඒ? දානයක කුසලය මහත්ඵල මහානිසංස වෙන්න බලපාන කරුණු තුනෙන් පළවෙනි කාරනය, ඒ කරන පූජාවෙන් ලබන්නාවූ තැනැත්තාට වන ප්‍රයෝජනය. ඔය කරුණු දහයකින් මම පැහැදිලි කළේ මේ කඨින චීවරය ලබන්නාවූ ප්‍රතිග්‍රාහකයන් වහන්සේට ලැබෙන ප්‍රයෝජනයයි.

## දායකයාගේ චිත්ත ශක්තිය

ඊළඟට දෙවෙනි කාරනය තමයි දායක පින්වතාගේ සිතුවිලි ශක්තිමත් වූ තරමට මේ පූජාවෙන් ලැබෙන කුසලය මහත්ඵල මහානිසංස වෙනවා. කොහොමද අන්‍ය පිංකමකට වඩා දායකයාගේ සිත මෙහිදී ශක්තිමත් වෙන්නෙ? මාස තුනක් මුළුල්ලෙහි මේ සඳහා වෙහෙසෙනවා. මාස තුනක් මුළුල්ලෙහි මේ සඳහා සිතුවිලි ගොඩනගනවා. මාස තුනක් මුළුල්ලේ මේ සඳහා ක්‍රියාත්මක වෙනවා කථාබහ කරනවා වැඩකටයුතු සංවිධානය කරනවා. මේ තරම් දිගු කාලයක් මුළුල්ලෙහි සිතුවිලි විහිදුවන කොට පළවෙනි වතාවට වඩා දෙවෙනි වතාවෙහි, දෙවෙනි වතාවට වඩා තුන්වෙනි වතාවෙහි කුසල් සිත ශක්තිමත් වෙනවා, බලවත් වෙනවා. සමහර වෙලාවට පහුගිය අවුරුද්දේ කඨින චීවර පූජාව නිමාවුණු තැන ඉඳලයි අපටත් ඊළඟ කඨින චීවරයට සම්බන්ධ වෙන්න ඕනෙ කියලා බොහෝ දෙනෙක් සකසුරුවම් වෙන්නේ. ඒ නිසා මාස තුනක් මුළුල්ලේ භික්ෂූන් වහන්සේලා වස් වසවාගෙන උපස්ථාන කරමින් මේ සඳහා සූදානම් වුණා.

අවුරුද්දක් මුළුල්ලේ බලාපොරොත්තු ඇතිකර ගත්තා. ඒ සෑම සිතුවිල්ලක් නිසාම නැවත නැවත කුසල් සිත බලවත් වෙනවා. බලවත් වූ ශක්තිමත් වූ සිතුවිලි පරම්පරාවක් ඇතිවයි මේ පූජාව සිද්ධ කරන්නේ. ඒ නිසා දායකයාගේ සිත අග්‍ර ආකාරයෙන් මේ පිංකමේදී සැකසිලා තියෙනවා.

ඒවගේම දායකයාගේ සිත තවත් සැකසෙන්නට දෙවෙනි කාරනයක් තමයි, මේ කඨින චීවරයක් පූජා කරන කොට තව බොහෝ අතිරේක පිංකම් කිරීම. එය මුල් කර ගෙන විහාරස්ථානයක නම් මල් පිංකම්, බෝධි පූජා පිංකම්, පිරිත් දේශනා ඒවගේම අෂ්ට පරිෂ්කාර පූජා අවශේෂ සිවුරු පිරිකර පූජා, ආහාර පාන පූජා, ඒ වගේම ඇඳ පුටු ආදී ගරුභාණ්ඩ පූජා, අනෙකුත් වස්ත්‍ර බෙහෙත් උපකරන මේ ආදී බොහෝ පූජාවන් කප්රුකක් හැටියට සකසලා පූජා කරනවා. කල්ප රුක්ෂයක් කියන්නෙ සිතු පැතු සම්පත් ලැබෙනවා කියන සංකේතයයි. සෑම කෙනෙකුටම ජීවත් වෙන්නට අවශ්‍ය සියළු ආම්පන්න මේ කඨින චීවරයක් සමඟ පූජා කරනවා. ඒ තරම් මහා පරිවාර පූජා සමූහයකින් පිරිවරණ ලද්දාවූ පූජාවක් නිසත් දායකයාගේ සිත අතිශයින්ම ශක්තිමත් වෙනවා.

ඒ වගේම මේ පිංකම අතිශයින්ම දුර්ලභ නිසත් දායකයාගේ සිත බොහෝ ශක්තිමත් වෙනවා. අපට හෙටත් මේ පිංකම කරගන්න පුළුවන් නම් අද මේ පිංකමට සම්බන්ධ වෙන්න බැරි වුණා කියල අපි කවුරුවත් කලබල වෙන්නේ නෑ. අනිද්දාටත් කරගන්න පුළුවන්, තව දවසකත් කරගන්න පුළුවන් කියලා අපේ සිත පසුබානව. නමුත් කඨින චීවරයක් පූජා කරන්න පුළුවන් වෙන්නේ යම් භික්ෂුවක් තුන් මාසයක් වස් වසවාගෙන උන්වහන්සේ වස් නොකඩා ආරක්ෂා කරන්ඩත් ඕන, එහෙම ආරක්ෂා කළත් ඒ අවුරුද්දෙ එක වතාවයි එක් ස්ථානයක කඨින චීවරයක් පූජා කරන්න පුළුවන්. ඒ දුර්ලභ භාවය නිසා දහසකුත් එකක් වැඩ කටයුතු පසෙක දාල හරි අපිත් මේ පිංකමට සහභාගි වෙන්න ඕනැයි කියන දැඩි සිතුවිල්ල මනස තුළ ඇතිවෙනවා. මේ දුර්ලභ භාවය නිසා අන්‍ය බොහෝ පිංකම් වලට වඩා දැඩිතර අධිෂ්ඨානයක්, කුසල් සිතක් මේ පිංකමේදි ඇතිවෙනවා. කඨින චීවර පූජාව ඒකාන්තයෙන් මහත්ඵල වෙන්නට ඒ හේතුවත්



බලපාවා.

ඊලඟට දායකයාගේ සිත සවිමත් වෙන්නට බලපාන හතරවෙනි කාරනය තමයි මේ කඨින චීවර පූජා සමයයි කියලා මේ මාසයක තරම් කාල වකවානුව මුළු ලොකයේම සැදැහැවත් බෞද්ධයෝ සෑම සියළු දෙනාම එක වගේ ක්‍රියාත්මක වෙනවා. මනුෂ්‍යයො පමණයි අපට පෙනෙන්නේ. නමුත් මනුෂ්‍යයො පමණක් නෙවෙයි දෙවියන් බඹුන් යක්ෂ භූත ප්‍රේත ආදී පිං කැමති සකල සත්වයෝම මේ මාසය මුළුල්ලේම කඨින චීවර පූජාවට ලකලෑස්ති වෙනවා. ලොකයේ ඇතිතාක් කඨින චීවර පූජාවන්ට සම්බන්ධ වෙනවා. සක්‍ර දේවේන්ද්‍රයා පවා මේ කාල වකවානුව විශේෂයෙන් වෙන් කරනවා කඨින චීවර පූජාවන්ට යොමුවෙලා ඒ කුසලය අනුමෝදන් වෙන්න. මේ ආකාරයට ලෝකයේ බොහෝ දෙනා මේ කඨින චීවර පූජා සමයයි කියලා කුසල් සිතුවිලි ගොඩනගන නිසා අපට ප්‍රබල සිතුවිලි ගොඩ නගන්නට එයත් සවියක් වෙනවා.

බොහෝ පාපකාරී සිතුවිලි ගොඩනගන්නා වූ මිනිසුන් අතර අපි එක්කෙනෙක් දෙන්නෙක් කුසල් සිතුවිලි මතු කරන්න හැදුවට ඒක බොහොම දුෂ්කරයි. බොහෝ දුර්වල වෙනවා. ඒ නිසයි බුදුහාමුදුරුවො දේශනා කළේ භික්ෂූන්ට භාවනා කරන්නට ආරණ්‍යට යන්න, ගස්මුලට යන්න, ජනයා නැති තැනට යන්න කියලා. අර මහජනයාගේ සිතුවිලිවල දූෂ්‍ය භාවයෙන් අපේ සිතුවිලි දූෂ්‍ය වෙලා දුර්වල වීම වළක්වන්න. නමුත් බොහෝ දෙනා එක හා සමානව කුසල් සිතුවිලි පහල කරනකොට මනස සිසිල් වෙනවා. මුළුමහත් අවකාශයම සිසිල් වෙනවා. ශක්තිමත් වූ කුසල් සිතක් ගොඩනගන්නට එයම පදනමක් වෙනවා. ඒ නිසා මේ කඨින චීවර පූජා සමයයි කියලා දෙවියන් සහිත බඹුන් සහිත ලෝක සත්වයින් ඒකරාශී වෙලා පිංකම් කරන කාලයක් නිසත් දායකයාගේ සිත ශක්තිමත් වෙනවා. මේක දුර්ලභ කුශල කර්මයක් නිසත්, බොහෝ පරිවාර පරිෂ්කාරයන්ගෙන්, පරිවාර පූජාවන්ගෙන් ආඪ්‍ය වූ නිසත්, දීර්ඝ කාලයක් බලාපොරොත්තු ඇතිකරගෙන කරන්නාවූ පූජාවක් නිසත් මේ කියන ලද කරුණුවලින් ශක්තිමත් වූ ප්‍රබල වූ කුසල් සිතකිනුයි අපි කඨින චීවර පූජාව සිද්ධ කරන්නෙ.

## ප්‍රතිග්‍රාහකයාගේ ගුණ සම්පත්තිය

ඊළඟට තුන්වෙනි කාරනය තමයි ප්‍රතිග්‍රාහකයාගේ ගුණ සම්පත්තිය මත කරන්නාවූ පූජාව මහත්ඵල මහානිසංස වෙනවා. පින්වතුනි, මේ ලෝකයේ කරන්නා වූ අනෙක් ඕනම පූජාවක කුසලය ඒ ඒ අවස්ථාවේ ලබන ප්‍රතිග්‍රාහකයන් අනුව අඩු වැඩි වෙන්න පුළුවන්. කඨින චීවර පූජාවේ කුසලය කවදාවත් ප්‍රතිග්‍රාහකයන් අනුව අඩු වැඩි වෙන්නේ නෑ. හැමදාමත් එක හා සමාන වෙනවා. ඇයි ඒ ? කවදත් මේ  කඨින චීවරය පූජා  කරන්නෙ මහා සංඝරත්නයටමයි. පෞද්ගලිකව කිසිදාක පුදන්නට බැරි එකම පූජාව කඨින චීවර පූජාව පමණයි. අන්‍ය ඕනම පූජාවක්  පෞද්ගලිකව පූජාකරන්නට පුළුවන්. ආවාසයක් හදලා වුණත් ඉඩමක් වුණත් ඕනම කෙනෙකුට පෞද්ගලිකව පූජා කරන්න පුළුවන්. නමුත් කඨින චීවරයක් කිසි දාක පෞද්ගලිකව පූජා කරන්න බෑ. එය පිදිය යුත්තේ මහා සංඝරත්නයටමයි. මහා සංඝරත්නයේ ගුණය සැමදා එක සමානයි. මහරහතන් වහන්සේලාගේ ගුණය අතීයේත් එකයි, අදත් එකයි, අනාගතයටත් එකයි. අනාගාමී උතුමන් සකෘදාගාමී උතුමන් සෝවාන් උතුමන් කියන මේ ආර්ය උත්තමයන්ගේ ගුණය අතීතයෙත් වර්තමානයේත් අනාගතයටත් එක හා සමානයි. නොවෙනස් වන්නා වූ අනන්ත වූ ගුණ සමුදායකින් පිරිපුන් උත්තමයින් වහන්සේලාගේ එම ගුණ සිහිපත් කරලා මහා සංඝරත්නය වෙනුවෙන් පූජා කරන නිසා කිසිදාක අඩුවක් නොවී මහා කුසලයක් ම කඨින චීවර පූජාව නිසා සිද්ධ වෙනවා.

අපි මේ චීවරය පූජා කරන්නෙ එක පන්සලක වස් විසූ භික්ෂුවකට නෙවෙයි. එක් පන්සලක ස්වාමීන් වහන්සේලා වස් වසවාගෙන උන්වහන්සේලාට උපස්ථාන කරලා  සකස් කරගත්තෙ මහා සංඝ රත්නයට කඨින සිවුරක් පූජා කරන්න අවශ්‍ය පසුබිමයි. බුදුහාමුදුරුවො පනවලා තියෙන නීති රීති වලට අන්තර්ගතවෙලයි මේ චීවරය පූජාකරන්න ඕනැ. ඒ නිසා ඊට අවශ්‍ය පසුබිම සකස්කරගත්තා පමණයි. මේ සකසා ගත්තා වූ චීවරය පූජා කරන්නේ මහා සංඝරත්නයටයි. කාටද මහා සංඝරත්නය කියලා කියන්නේ? අතීතයේ වැඩ සිටි සියළු භික්ෂූන් වහන්සේලා, අනාගතයට පහලවෙන සියළු භික්ෂූන් වහන්සේලා, වත්මන් ලෝකයේ වැඩ සිටින සියළු භික්ෂූන් වහන්සේලා. මේ කාලත්‍රයටම අයත් භික්ෂූන් වහන්සේලාගේ ගුණ සලකාගෙන ඒ අනන්ත ගුණ වෙනුවෙනුයි අපි පුදන්නේ කියන සිත ඇතිකරගෙනයි කඨින චීවරය පූජා කළ යුත්තේ.



මා මුලින් සඳහන් කළා මේ චීවරයට අර්හත් ධජයයි කියනවා කියලා. ඇයි ඒ ? මහරහතන් වහන්සේලා විසින් පරිහරණය කළාවූ වස්ත්‍රය නිසාත්, මහරහතන් වහන්සේලා බිහිකරන්ට උපකාර වන වස්ත්‍රය නිසාත්. මෙබඳු චීවරයක් ගත දරාගෙන අතීත කාලයේ යම් තාක් මහරහතන් වහන්සේලා පහල වුණාද, අවශේෂ රහතන් වහන්සේලා පහල වුණාද, වත්මන් ලෝකයේ අප නොදැන හෝ යම්තාක් රහතන් වහන්සේලා වැඩ සිටීද, අනාගත කාලයෙහි සම්බුද්ධ ශාසනය පවතිනතුරු යම් තාක් රහතන් වහන්සේලා බිහිවේද, ඒ අතීත වර්තමාන අනාගත කියන තුන් කාලයටම අයත් මහරහතන් වහන්සේලාගේ අනන්ත ගුණය වෙනුවෙන් මේ කඨින චීවරය පූජා කරනවා කියන අදහස ඇති කරගෙන පූජා කරන්න ඕන. යම් අනාගාමී උතුමන් වහන්සේ නමක් අතීතයෙහි වැඩ සිටියාද, වර්තමානයේ වැඩසිටීද, අනාගතයට පහල වේද, යම් සෝවාන් සකෘදාගාමී ආයර්‍ය උතුමන් වහන්සේ නමක් අතීතයේ වැඩසිටියේද, වර්තමානයේ වැඩ සිටීද, අනාගතයට පහලවේද ඒ ආයර්‍ය උතුමන් වහන්සේලාගේ අනන්ත ගුණය වෙනුවෙන් මේ කඨින චීවරය අපි පූජා කරනවාය කියන අදහස ඇතිකරගෙන පූජාකරන්න ඕන. ඒ වගේම ඒ ආයර්‍ය භාවයට පත්වෙන්නට ප්‍රතිපත්ති පුරන්නා වූ සිල්වත් ගුණවත් භික්ෂු පිරිසක් අතීතයේ වැඩ  සිටියාද, අද ලෝකයේ වැඩ සිටිනවාද, මත්තට ඇතිවෙනවාද ඒ සියළු උතුමන් වහන්සේලාගේ අනන්ත සීලාදී ගුණයන් වෙනුවෙනුත් උන්වහන්සේලාට සීලාදී ගුණයන් තහවුරු කරගනිමින් අර්හත් මාර්ගයට පිවිසෙන්නට උපකාරයක් වශයෙනුත් අපි හැමදෙනාම විසින් ගෞරවයෙන් සකසා ගත්තාවූ මේ කඨින චීවරය පූජා කරනවා කියන හැඟීම ඇතිකරගන්න ඕන.

## පාපී සිතුලවිල්ලක නපුර !

මහරහතන් වහන්සේ නමකගේ ගුණය අනන්තයි.

අප්‍රමාණයි පින්වතුනි. රහතන් වහන්සේ කෙනෙකුගේ ගුණය අපට මෙපමණයි කියලා සීමා කරන්න බෑ. ඒ කුමක් නිසාද? එක ක්ලේශ ධර්මයක් නිසා මේ ලෝකයට වන විපත් අපමණයි. එබඳු දහසකුත් එකක් ක්ලේශ ධර්මයන් සහමුලින්ම නැතිකළ උතුමන් වහන්සේටයි රහතන් වහන්සේ කියලා කියන්නේ. අපි සාමාන්‍යයෙන් ගෙන බැලුවොත් ද්වේශය නැමති එක් පාප චේතනාවක් එක් මිනිසකුගේ සන්තානයේ ඇති වුණොත් කොතරම් ලෝකයට විපත් කරනවද? මගේ හදවත තුළ තවත් මනුෂ්‍යයෙක් කෙරෙහි ද්වේශය පහල වුණොත් ඒ ද්වේශය නිසා මා විනාශ වෙනවා.ඒ මගේ ද්වේශයට ලක්වුණු මනුෂ්‍යයා එයින් විනාශ වෙනවා. ඒ විදියෙන් දෙපාර්ශ්වයක් ද්වේශයෙන් කැකෑරෙන කොට ඒ අයට හිතවත් හිතවත් අය ඒ දෙපාර්ශ්වයට ඒකරාශී වෙනවා. ඊට පස්සේ එක් සන්තානයක හට ගත්තාවූ ද්වේශය දෙපිරිසක් අතර ප්‍රශ්නයක් බවට පත්වෙනවා. ඒ විදියට දෙපිරිසක් ද්වේශයෙන් දෙපැත්තට වෙනකොට ඒ ඒ අයට හිතෛශී යක්ෂ භූතාදීනුත් ඉන්නවා. ඒ අයත් දෙකඩ වෙනවා. දේවතා ආදී පෘතග්ජන සත්ව කොට්ඨාසත් ඉන්නවා. ධ්‍යාන නොලැබූ එල නොලැබූ බොහෝ පක්ෂග්‍රාහී දේවතාවොත් ඉන්නවා. ඒ අයත් අර දෙපාර්ශ්වයට බෙදෙනවා. ඒ ඒ අයත් තමන් කැමති පිලටයි පක්ෂපාත වෙන්නෙ. එහෙම වෙනකොට දේව ලෝකෙත් දෙකඩ වෙනවා. මේ විදියට එක් පුද්ගලයෙක් තුළ ගොඩනැගෙන්නාවූ වෛරය නිසා මිනිස් සමාජය දෙකඩ වෙනවා, භූත ලෝකය දෙකඩ වෙනවා, දේව ලෝකය දෙකඩ වෙනවා.

ඒ වෛරී පුද්ගලයන් දෙදෙනා සමාජයේ සැලකිය යුතු අය නම්, තවත් රටක් මේකට සම්බන්ධ වෙනවා. ඊට පස්සෙ අනෙක් රටවලුත් ප්‍රශ්නයට සම්බන්ධ වෙනවා. පසුව මෙය මුළු ලෝකයේම ප්‍රශ්නයක් බවට පත් වෙනවා. මනුස්ස ලෝකයේ සියළු දෙනාගේ සිත්සතන් විනාශ කරන මහා විපත්තියක් ඒ තුළින් ඇති කරනවා. දේව ලෝකය කලම්බන, භූත ලෝකය විනාශ කරන මහා විපත්තියක්. එක් මනුෂ්‍යයෙකුගේ සන්තානය තුළින් මතු වෙන්නාවූ ද්වේශය නිසා මේ මුළු මහත් ලෝකයටම අනර්ථයක් සිද්ධ වෙනවා. ඒ විදියට වැඩෙන්නා වූ ද්වේශය ඇතිව යමෙක්



ඝාතනය කළොත් ඒ ඝාතනය කළා වූ අකුශල කර්මය නිසා ඒ තැනැත්තා අනන්ත අප්‍රමාණ කාලයක් නරකාදී අපා දුක් විඳිනවා. ඝාතනයට ලක්වුණ පුද්ගලයාගේ ඥාති මිත්‍රාදීන් වෛරයෙන් අර තැනැත්තාගේ පරම්පරාව පවා විනාශ කරනවා. උපනුපන් ආත්ම භවයන් හිඳී වෛර කරනවා.

දේවදත්ත නැමති එක් පුද්ගලයකුගේ හදවතේ මතුවුණාවූ වෛරී චේතනා නිසා සම්බුද්ධ ශාසනයකත් මහත් වූ ආන්දෝලනයක් ඇති කරලා තමන් අපාගත වුණා විතරක් නෙවෙයි දස දහස් ගණන් මනුෂ්‍යයෝ අපායට යන තැනට කටයුතු කළා. මේ කුමක බලයක්ද? එක් ද්වේශ සිතිවිල්ලක් නිසා ගොඩනැගුනාවූ බලයයි. මේ තරම් මුළු මහත් සත්ව සමූහයාටම විපත්ති දායකයි මේ එක් අකුසල සිතුවිල්ලක්. අකුසල කර්ම ක්‍රියාත්මක වෙද්දී පමණක් නෙවෙයි විපාක දෙද්දීත් සිදු වෙන්නෙ අනර්ථයක්මයි.

එක් අවස්ථාවක භාර්‍යාවගෙ නොමග යැවීම නිසා මුලා වුණු ස්වාමියෙක් භාර්‍යාවගේ මතයට එකඟවෙලා තමන්ගේ මවුපියන් දෙදෙනා වනාන්තරයට අරගෙන ගිහිල්ලා දඬු මුගුරු වලින් තලලා විනාශ කළා. ඒ පුද්ගලයො දෙදෙනා ඒ පාප කර්මයෙ විපාක වශයෙන් දිගු කලක් නිරයෙ ඉපදිලා දුක් විඳලා එහි අවශේෂ කර්ම විපාකය මනුලොව ඉපදිලත් විඳින්න සිදු වුණා. පිරූ පාරමී ගුණ බලය නිසා උන්වහන්සේ පසු කලෙක අර්හත්වයට පැමිණ මුගලන් මහරහතන් වහන්සේ නමින් ප්‍රකට වුණා. අර්හත්වයට පත් වුණත් අර අකුශල කර්මය උන්වහන්සේට විපාක දුන්නා. හොරු පන්සීයක් එකතු වෙලා සම්පූර්ණ ඇටකටු බිඳෙන තුරු තැලුවා. උන්වහන්සේ ගේ අකුශල කර්මය විපාක දුන්නාය කියල අර හොරුන්ට පාපය සිද්ධ නොවී තියෙන්නෙ නැහැ. ඒ හොරු සියළු දෙනා ආනන්තරීය පාප කර්මයක් සිද්ධ කර ගත්තා රහතන් වහන්සේ නමක් ඝාතනය කරලා. එහෙම නම් අකුශලය සිද්ධ වෙන මොහොතේත් මුළු මහත් සමාජයටම විපත්ති දායකයි. එය විපාක දෙන මොහොතේත් අන් සියළු දෙනාට පවු රැස්කර ගන්නට හේතු වෙනවා. ඒ පන්සීයක් දෙනා ඒ අකුශලය කරගෙන අනතුරට පත්වුණේ අර මුල් අකුශල කර්මය එක් පුද්ගලයෙක් සතුව තිබුණු නිසයි. ඒ පන්සිය දෙනාටම ඒ අකුශල කර්මය

විපාක දෙනවිට තව පන්සිය දෙනා පන්සිය දෙනා එකතුවෙලා තැළුවොත්? ඒ අයට තව පන්සීය පන්සීය එකතුවෙලා තැළුවොත්? ආත්ම පනහක් හැටක් සීයක් දහසක් යනකොට මුළු විශ්වයම එකම අකුශල කර්මයකින් බැඳිලා. මේ තරම් විපතක් හානියක් සිද්ධ වෙනවා ද්වේෂය නැමති එකම පාප ධර්මයක් නිසා.

ඒ මහරහතන් වහන්සේලා මේ මුළු ලෝකයම විනාශ කරන්නට සමර්ථ වූ මේ ද්වේශය නැමති පාප ධර්ම නැවත කිසි දිනක නූපදින ආකාරයෙන් ප්‍රහාණය කරලා පාරිශුද්ධත්වයට පත් වුණා. ද්වේශය නැමති පාප ධර්මය ප්‍රහාණය කිරීමෙන් පිරිසිදු වූ ඒ රහතන් වහන්සේලාගේ ශ්‍රේෂ්ඨ ගුණය වෙනුවෙනුයි අපි කඨින චීවරය පූජා කරන්නේ.

## මෙත් සිතක බලය

මුළු මහත් විශ්ව ධාතුවටම අනර්ථකර වූ තෘෂ්ණාව වෛරය මුලාව ආදී කොට ඇති එක්දහස් පන්සීයක් පමණ ක්ලේශ ධර්මයන් නැවත කිසි දාක නූපදින ආකාරයෙන් උන්වහන්සේලා ප්‍රහාණය කරලා පාරිශුද්ධත්වයට පත්වුණා. එපමණක් නෙවෙයි උන්වහන්සේලා අතිරේක වශයෙන් කරුණා දයා මෛත්‍රී ආදී ගුණයන් වැඩුවා. මේ සමාජට කිසිම සේවයක් කරන්නට කලඑලියට නැවිත් වනාන්තර ගතවෙලාම අර්හත්වයට පැමිණ, වනාන්තර ගතවෙලාම පරිනිර්වාණයට පත් වුණත් උන්වහන්සේගෙන් මේ ලෝකයට සිද්ධවෙන සේවය මෙපමණය කියා ප්‍රමාණ කරන්නට පුළුවන් කමක් නෑ. එක්තරා රහතන් වහන්සේ නමක් වනාන්තරයක බොහෝ මෛත්‍රිය පතුරමින් වාසය කළා. දවසක් උන්වහන්සේ වස් සමාදන් වෙලා වස්කාලය අවසානයේදී වස් පවාරණය කරලා එතනින් පිටත්වෙලා යන්න සූදානම් වෙනකොට පෙර දින රාත්‍රී සක්මන කෙලවර කවුදෝ හඬන ශබ්දයක් ඇහුනා. රාත්‍රියේ කවුද මෙතන අඬන්නෙ කියලා අහනකොට කිව්වා ''මම මේ සක්මන කෙලවර ඉන්න රුක්ෂ දේවතාවා.'' ''ඇයි ඔබ මේ අඬන්නේ?'' ''ස්වාමීනි ඔබවහන්සේ මේ වස් තුන්මාසය මේ වනාන්තරයේ වස් වසලා වැඩසිටි නිසා ඔබ වහන්සේ'ගේ මෙත් සිතේ බලයෙන් මේ මුළු වනාන්තරයෙම අමනුෂ්‍යයෝ ඔවුනොවුන්ට විරසක නොවී



සිටියා. දෙවි බඹුන් සියළු දෙනා ඔවුනොවුන්ට මිත්‍රව සිටියා. තිරිසන් සත්තු ඔවුනොවුන්ට විරසක වුණේ නෑ. ඔබ වහන්සේ හෙට මෙතනින් පිටත්වෙලා ගියයින් පස්සේ නැවතත් ඒ අය කා කොටා ගන්න පටන් ගන්නවා. මේ විපත්තිය දැකලා ඔබවහන්සේ නවත්වා ගන්නටයි මම මේ හඬා වැලපුනේ'' කියලා කිව්වා. එතනදී මේ මහරහතන් වහන්සේ කියනවා ''ඔබට යහපතක් වෙනවානම් තව එක් වසරක් මම මෙහෙ නැවතිලා ඉන්නම්.'' තවත් වර්ෂයක් නැවතිලා ඉඳලා නැවතත් වස් පාවාරණය කරලා පිටවෙන්ට හදනකොට නැවතත් අර දේවතාවා හඬා වැලපුණා. මේ විදියට පින්වතුනි වර්ෂයෙන් වර්ෂය වර්ෂයෙන් වර්ෂය එතන නැවතිලා පරිනිර්වාණයට පත්වෙන තුරුම ඒ රහතන් වහන්සේ එතන නැවතී සිටියා. උන්වහන්සේ සමාජයට සේවයක් කළා කියලා කිසි කෙනෙක් නොදැක්කත් ඒ මහ වනාන්තරයේ ඉඳගෙන හුදකලාව උන්වහන්සේගෙන් දිව්‍ය ලෝකයටත් මනුෂ්‍ය ලෝකයටත් තිරිසන් ලෝකයටත් භූත ලෝකයටත් මේ මුළු තුන් ලෝකයටම මහා යහපතක් සිද්ධ වුණා.

## මහ සඟරුවනට පූජා වේවා !

මේ ආකාරයෙන් ඒ ආර්ය උතුමන් වහන්සේලා කෙලෙස් ප්‍රහාණය කිරීම නිසත් ලෝකයේ පූජා ලබන්නට සුදුසුයි. කරුණා මෛත්‍රී ශ්‍රද්ධා ප්‍රඥා ආදී ගුණයන් වැඩූ නිසත් ලෝකයේ සියළු දෙනාගේම පූජාවන් ලබන්නට සුදුසුයි. ඒ පමණක් නෙවෙයි අවුරුදු දෙදහස් පන්සිය ගණනක් මුළුල්ලේ මේ සම්බුද්ධ ශාසනය අවිච්ඡින්නව නිර්මල දහම මෙතෙක් පවත්වාගෙන ආවෙ උන්වහන්සේලා විසින්. පොතපතේ කොතෙක් ලියා තිබුණත් ප්‍රායෝගිකව උන්වහන්සේලා මේ දහම ප්‍රගුණ නොකළා නම් අපට කවදාවත් මෙබඳු පිවිතුරු දහමක් ඉතිරි වෙන්නේ නෑ. ඒ මහරහතන් වහන්සේලා නිසයි මේ දහම රැකුනේ. අනාගාමී සකෘදාගාමී සෝවාන් ආදී ආර්ය උතුමන් නිසයි මේ දහම රැකුනේ. ඒ ආර්ය භාවයට පත්වෙන්නට ප්‍රතිපත්ති පිරූ සිල්වත් ගුණවත් භික්ෂූන් වහන්සේලා නිසයි මේ දහම රැකුනේ.

සකල ක්ලේශයන් ප්‍රහීන කළාවූ උතුමන් ගේ ඒ නික්ලේශී ගුණය වෙනුවෙන් මේ කඨින චීවරය අපි පූජා කරනවා, ඒ වගේම

කරුණා මෛත්‍රී ශ්‍රද්ධා ප්‍රඥා ආදී ශ්‍රේෂ්ඨ ගුණයන්ගෙන් පෝෂණය වූ ආයර්‍ය උතුමන්ගේ ආයර්‍ය ගුණය වෙනුවෙන් මේ කඨින චීවරය පූජා කරනවා, දෙදහස් පන්සිය ගණනක් මුළුල්ලෙහි මේ සම්බුදු දහම පවිත්‍රව අපවෙත දායාද කළාවූ ඒ ශ්‍රේෂ්ඨ බුද්ධ පුත්‍රයන් වහන්සේලාගේ උත්තරීතර ගුණය වෙනුවෙන් අපි මේ කඨින චීවරය පූජා කරනවා කියන අදහසින් පූජා කරන්න ඕන. ඒ වගේම මේ චීවරය යම් කිසි භික්ෂූන් වහන්සේ නමක් දරනවා නම් ඒ භික්ෂූන් වහන්සේලාටත් සුවසේ මහණදහම් සපුරා ගන්නට ශක්තිය ධෛර්‍යය ලැබේවා, මනසෙහි මතුවෙන්නා වූ දහසකුත් එකක් පාප ධර්මයන් ක්ලේශ ධර්මයන් ප්‍රහාණය කරන්නට, අප විසින් පූජා කරන්නාවූ කඨින චීවරය උන්වහන්සේලාට මහෝපකාරී වේවා, උන්වහන්සේලාත් ප්‍රාර්ථනා කරන ආකාරයට සියළු සමාජ බන්ධනයන් ගෙන් නිදහස් වෙලා, සියළු ක්ලේශ බන්ධනයන් ගෙන් නිදහස් වෙලා, සියළු මාර බන්ධනයන් ගෙන් නිදහස් වෙලා, සියළු සාංසාරික දුක්ගිණි වලින් නිදහස් වෙලා අමා මහ නිර්වාණ සුවය සාක්ෂාත් කරගන්නට ඒ ස්වාමීන් වහන්සේලාටත් අපි මේ පූජා කරන්නාවූ කඨින චීවරය මහෝපකාරී වේවා කියන මෛත්‍රී සිත ඇතිකරගෙන, අතීත වර්තමාන අනාගත කියන තුන් කාලයට අයත් වූ මහරහතන් වහන්සේලා ඇතුළු පෘතග්ජන භික්ෂූන් වහන්සේලා දක්වා ආයර්‍ය වූද අනායර්‍ය වූද මහා සංඝරත්නය වෙනුවෙන් අප හැමදෙනා විසින්ම ශ්‍රද්ධාවෙන් ගෞරවයෙන් සකසා ගත්තාවූ මේ කඨින චීවරය පූජා කරනවා පූජා වේවා! පූජා වේවා!! කියන සිත ඇතිකරගෙන මේ වාක්‍යය කියලා කඨින චීවරය ඇතුළු සියළු පරිෂ්කාර සඟසතු කොට පූජා කරන්න.

**සපරිවාරං ඉමං කඨින චීවරං සංඝස්ස දේම**
**සපරිවාරං ඉමං කඨින චීවරං සංඝස්ස දේම**
**සපරිවාරං ඉමං කඨින චීවරං සංඝස්ස දේම**

පරිවාර පරිෂ්කාර සහිත වූ මේ කඨින චීවරය අනන්ත ගුණයෙන් යුක්ත වූ මහා සංඝරත්නයට පූජා කරමි. පූජා වේවා !

## කඨිනානිසංස

මේ කඨින චීවරය නිසා භික්ෂූන් වහන්සේ නමකට ලැබෙන



යහපත ප්‍රයෝජනය කොතෙක්ද යන්නයි අපි මෙතෙක් පැහැදිලි කළේ. ඒ යහපත ඒ ආකාරයෙන්ම විපාක වශයෙන් මේ පූජා කළාවූ දායක පින්වතුන්ට ලැබෙනවා. උපනුපන් සියළු ආත්ම භවයන් හිදී දිව්‍ය සම්පත් මනුෂ්‍ය සම්පත්, පරිවාර සම්පත්, ආහාරපාන ඉඳුම්හිටුම් වස්ත්‍රාභරණ ඒ වගේම සියළු දෙනාගේ ගරු බුහුමන් වැඳුම් පිදුම් පූජා සත්කාර මේ සියල්ලක් ලබන්නට කඨින චීවර පූජාව හේතු වෙනවා. හාත්පසින් පැමිණෙන්නා වූ සියළු උපද්‍රවයන්ගෙන් ආරක්ෂා වන්නට හේතු වෙනවා. සියළු අකුශල කර්ම බලයන්ගෙන් ආරක්ෂා වෙන්නට හේතුවෙනවා. ඒ වගේම සියළුම රජ සම්පත් සිටු සම්පත් මූලික කොට ඇති සියළු මනුෂ්‍ය සම්පත් ලබන්නට හේතු වෙනවා. මනුෂ්‍ය ලෝකයේ චක්‍රවර්ති රාජ්‍ය සම්පත් ලබන්නට දෙව්ලොව සක්දෙව් රාජ්‍ය සම්පත් ලබන්නට හේතුවෙනවා. ඒ වගේම බ්‍රහ්ම ලෝකයේ උපදින්නට අවශ්‍ය ආකාරයෙන් ධ්‍යාන ආදිය උපදවන්නට හේතු වෙනවා. මනුලොව උපන්නත් දෙව්ලොව උපන්නත් සියළු දෙව් මිනිසුන් අභිබවා ආයුෂයෙන් වර්ණයෙන් සැපයෙන් බලයෙන් ප්‍රඥාවෙන් පිරිවරින් යසසින් ආඪ්‍ය වූ වාසනාවන්ත ප්‍රඥාවන්ත ශ්‍රේෂ්ඨ ජීවිත ලබන්නට මේ කුසලය හේතු වෙනවා. ඒ ආකාරයෙන් සසර ගමනේ තමන් කැමති තාක් දෙව්මිනිස් සැප ලබන්නටත් ඒ වගේම ඉතා ඉක්මනින් මේ සියළුම සමාජ බන්ධනයන්ගෙන් නිදහස් වෙලා සියළුම ක්ලේශ බන්ධනයන්ගෙන් නිදහස්වෙලා සියළුම මාර බන්ධනයන්ගෙන් නිදහස් වෙලා සකලක්ලේශයන් ප්‍රහීන කරලා නිවන් අවබෝධ කරන්නටත් හේතු වන මහා කුශලයක් මේ තුළින් සිද්ධ කරගත්තා කියලා සතුටු වෙන්න පුළුවන්.

මේ සිද්ධ කරගත් උදාර කුසලයෙන් සසර වාසය කරන තාක් නරකාදී සතර අපායකට මිත්‍යාදෘෂ්ඨි කුලයකට පත් නොවේවා! කල්‍යාණමිත්‍ර සම්පත්තිය සද්ධර්ම ශ්‍රවනය ලැබේවා! උපනුපන් සියළු ආත්ම භවයන් හිදී මේ කුශල බල මහිමයෙන් අපගේ ප්‍රාර්ථනාවන් සිහිපත් වේවා! මේ ජීවිතයේ නැවැත්වූ තැන් පටන් අඛණ්ඩව පාරමිතා පුරන්නට සිහි කල්පනාව මතුවේවා! එසේ වහවහා පාරමී ධර්මයන් සම්පූර්ණ කරගෙන තම තමන් ප්‍රාර්ථනා කරන බෝධියකින් සුවසේ නිවන් අවබෝධ කරන්නට මේ කුසලය හේතුවේවා වාසනා වේවා කියලා ප්‍රාර්ථනා කරන්න.

## නාගිත ථේරාපදානය

කල්ප අනූ එකකට පෙර විපස්සී බුදුරදුන් සමයෙහි මහා සංඝ රත්නයට කඨින චීවරයක් පූජා කොට තමන් ලැබූ විපාක නාගිත තෙරුන් වහන්සේ විසින් ගෞතම බුදුරදුන් සමීපයෙහි අනාවරණය කරමින් ප්‍රකාශ කරන ලද ගාථා පෙළක් ''නාගිත ථෙර අපදානය" නමින් පුරාණ ග්‍රන්ථවල දක්වේ. කඨින චීවර පූජාවේ ආනිසංස කෙබඳුදැයි හඳුනා ගැනීමට උපකාර වන බැවින් ඉන් තෝරා ගත් ගාථා පෙළක් සන්න සහිතව මෙහි දක්වනු ලැබේ.

01. **සකං කම්මං පකාසෙසි අනොතත්ත මහාසරෙ**
**නගරෙ බන්ධුමතියා අහං දනපතී අහුං**

නාගිත තෙරුන් වහන්සේ අනෝතත්ත විල් තෙරදී තම (අතීත) කර්මය මෙසේ ප්‍රකාශ කළේය. ''මම පෙර බන්ධුමතී නගරයෙහි දානපතියෙක් වීම,

02. **කප්පෙමි සබ්බකාමානං නානාපච්චයදයකො**
**අච්ඡාදනෙන සයනෙන අන්නපානෙන යාගුයා**
**සක්කච්ච සහත්ථා ච සන්තප්පෙත්වාන භික්ඛවො.**

භික්ෂූන් වහන්සේලාට ආහාර පාන, කැඳ, සිවුරු පිරිකර, සෙනසුන් ආදී නානාවිධ ප්‍රත්‍යයෙන් සියතින් සකසා උපස්ථාන කරන, භික්ෂූන් පෝෂණය කරන දායකයෙක් වීමි.

03. **චාතුද්දසිං පඤ්චදසිං යාව පක්ඛස්ස අට්ඨමිං**
**පාටිහාරිය පක්ඛඤ්ච අට්ඨඞ්ගිකමුපොසථං.**

අටවක, තුදුස්වක, පසළොස්වක හා සෘතුවේ මුල් පක්ෂය (මුල් දින පසලොස) උපෝසථ අෂ්ඨාංග සීලය සමාදන්ව ආරක්ෂා කළෙමි.

04. **යාවජීවං අහං තස්ස භික්ඛු බුද්ධස්ස සාවකො,**
**පසන්නචිත්තො සුමනො අහොසිං පරිවාරකො.**

මම දිවි ඇතිතෙක් බුදුරජාණන් වහන්සේ කෙරෙහිද,



ශ්‍රාවක භික්ෂූන් කෙරෙහිද පැහැදුණු සතුටු සිත් ඇතිව උන්වහන්සේලාගේ පරිවාරකයෙක් වීමි.

05. **වස්සං වුත්ථභික්ඛූනං කඨිනදනං අදසහං,**
**පවාරිතො භික්ඛුසංඝෙසා පතිගණ්හි කඨිනං මම.**

වස් වැස පවාරණය කළ භික්ෂූන්ට එදා මම කඨින සිවුරක් පිදුවෙමි. උන්වහන්සේලා මාගේ කඨින චීවරය පිළිගත්හ.

06. **කායෙන වාචා මනසා භික්ඛුසංඝං ඛමාපයිං,**
**අඤ්ජලිමපග්ගහෙත්වාන කත්වාචෙව පදක්ඛිණං**

පසුව ඇඳිලි බැඳ භික්ෂූන් වහන්සේලාව ප්‍රදක්ෂිණා කොට කයින් වචනයෙන් සහ සිතින් භික්ෂු සංඝයා සමා කරවා ගතිමි.

07. **කඨිනදනං දත්වාන සංඝෙ ගුණවරුත්තමෙ,**
**ඉතො තිංසෙ මහාකප්පෙ නාභිජානාමි දුග්ගතිං,**

ගුණයෙන් උතුම් වූ සංඝරත්නය උදෙසා කඨින චීවරයක් පුදා මින් එපිට මහා කල්ප තිහක් දුගතියක නූපන්නෙමි.

08. **අට්ඨාරසන්නං කප්පානං දෙවලොකෙ රමාමහං,**
**චතුත්තිංසක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජමකාරයිං.**

කල්ප දහ අටක් දෙව්ලොව සැප වින්දෙමි. තිස්හතර වාරයක් සක්දෙව් රජව දිව්‍ය රාජ්‍යය කළෙමි.

09. **ආරපථෙ ආරපථෙ චක්කවත්තිසුඛං ලභෙ,**
**පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියා.**

කඨින චීවරය මැසීමේදී ගසන ලද ඉදිකටු පාර ගණනට චක්‍රවර්ති රාජ්‍ය සම්පත් ලැබීමි. මහත් වූ ප්‍රදේශ රාජ්‍ය ලැබූ වාර ගණන ප්‍රමාණ කළ නොහැක.

10. **භොගෙ මෙ ඌනතා නත්ථි කඨිනදනස්සිදං ඵලං**
**යත්ථ යත්ථූපපජ්ජාමි ලභිත්වා සබ්බසම්පදං,**
**පරිසානං උත්තමො හොමි කඨිනදනස්සිදං ඵලං.**

මගේ භෝග සම්පත් කිසිදා අඩු නොවේ. යම් යම් තැනක උපදිම්ද, ඒ ඒ තැන සියළු සම්පත් ලබා පිරිස අතර උත්තම තත්වයට පත් වීමි. මේ කඨින චීවර දානයේ ඵලයයි.

11. **ජහිත්වා දෙවපුරං රමමං මානුසෙ උපපජජහං,**
**මනුසසානං උත්තමො හොමි කඨිනදනසසිදං ඵලං.**

දෙව් ලොවින් ච්‍යුතව මනුලොව උපන් සියළු කල්හි මිනිසුන් අතර උත්තම වීමි. මේ  කඨින චීවර දානයේ ඵලයයි.

12. **තෙනෙව කුසලකමෙමන පියොහං දෙවමානුසෙ,**
**තථෙව භද්දකමමසස පතෙතාමහි අචලං පදං.**

එම කුශල කර්මයෙන් මම දෙවියන් අතරත් මිනිසුන් අතරත් ප්‍රිය වීමි. එම කඨින චීවර දානමය කුශල බලයෙන්ම අචල පදය වූ නිර්වාණයටද පැමිණියෙමි.

13. **අහො මෙ සුකතං කමමං යං දනමදදිං තදා,**
**දුගගතිං නාභිජානාමි කඨිනදනසසිදං ඵලං.**

එදා මා විසින් කඨින දානයක් දීමෙන් කරන ලද කුශලය ආශ්චර්‍ය්‍යය. එයින් කිසි දා දුගතියෙහි නූපන්නෙමි. මේ කඨින චීවර දානයේ ඵලයයි.

14. **දෙව භවෙ උපපජජාමි දෙවෙ වා පිච මානුසෙ,**
**අඤ්ඤං ගතිං නජානාමි කඨිනදනසසිදං ඵලං.**

මනුලොව දෙව් ලොව යන දෙගතියෙහි පමණක්ම උපන්නෙමි. අන්‍ය (පහත්) ගතියකට නොපැමිණියෙමි. මේ කඨින චීවර දානයේ ඵලයයි.

15. **දෙව මෙ කුලෙ පජායාමි ඛතතියෙ වාපි බ්‍රාහමණෙ,**
**හීනෙ කුලෙ නජානාමි කඨිනදනසසිදං ඵලං**

මනුෂ්‍ය ලොකයෙහි ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ යන කුල දෙකෙහි



පමණක්ම උපන්නෙමි. පහත් කුලයක නූපන්නෙමි. මේ කඨින චීවර දානයේ ඵලයයි.

16. **පවත්තං සබබදනානං කඨිනදනමනුත්තරං,**
**අගගං පුඤ්ඤං ච සෙට්ඨං ච සබබමෙතෙන ලබහති.**

පවත්වන්නා වූ දානයන් අතර කඨින දානයම අග්‍ර වූ ශ්‍රේෂ්ඨ වූ උත්තම වූ පිංකමයි. එම කඨින දානයෙන් ( ලෞකික වූද ලෝකෝත්තර වූද) සියළු සැප ලබයි.

17. **යාවතා සබබදනානං ඛුද්දකානි බහූනි ච,**
**එකසස කඨිනදනසස කලං නාගඝනති සොළසිං**

යම් තාක් කුඩා වූ හෝ මහත් වූ හෝ දානයන් වේද, ඒ සියළු දානයන් කඨින දානයෙන් සොළොස් කලාවෙන් කලාවක් තරම්ද නොවටී. (එකක් 16 ට බෙදා ඉන් කොටසක් ගෙන නැවත 16න් බෙදූ කල්හි ලැබෙන කොටස ''සොළොස් කලාවෙන් කලාව" නම් වේ.)

18. **පඤ්චානිසංසසහිතං පඤ්ච දෙසවිවජ්ජිතං,**
**හන්තිවජජංහි සංඝසස තසමා කඨිනමුත්තමං.**

භික්ෂූන්ට ආනිසංස පහක් ලබාදෙන බැවින්ද, දෝෂ පහක් දුරු කරන බැවින්ද, සංඝයාගේ දෝෂ දුරු කිරීමෙහි සමත් බැවින්ද කඨිනය උතුම් වේ.

19. **තෙනෙව කුසලකමෙමන චෙතනා පණිධීහි ච,**
**ජහිත්වා මානුසං දෙහං තාවතිංසෙ රමාමහං.**

එම කුශල කර්මයේ බලයෙන්ද, ප්‍රාර්ථනා බලයෙන්ද මිනිස් කය අතහැර තව්තිසා දෙව්ලොව උපන්නෙමි.

20. **තත්‍ථ මෙ සුකතං ව්‍යමහං සුවණ්ණඤ්ච පභසසරං,**
**සතයොජනආයාමං තිංසයොජනවිත්‍ථතං**
**සට්ඨියොජනමුබෙබධං පාසාදමහි අගඤ්ඡහං.**

එහි යොදුන් සියයක් දිග, යොදුන් තිහක් පළල, සැට

යොදුනක් උස ස්වර්ණමය වූ ප්‍රභාෂ්වර වූ ප්‍රාසාදයක උපන්නෙමි.

21. **ආධිච්චවණ්ණං රුචිරං පභස්සරං,**
**ව්‍යම්හං සුභං කඤ්චනජාලඡන්නං**
**සරීරං මෙ සුරියසමානවණ්ණං**
**අනොමරංසීව නභෙ විරොචති.**

සූර්‍යාලෝකය මෙන් බබලන ප්‍රභාෂ්වර වූ රන්රසු දැලින් ආවරණය වූ මාගේ ශරීරය ආකාශයේ බබලන සූර්‍යයා මෙන් විය.

22. **ආකිණ්ණං භවනං මය්හං නච්චගීතසමාකුලං,**
**සට්ඨිංතුරියසහස්සානි සෙය්‍යා බොධං කරොන්ති මෙ.**

එහි මාගේ භවන නිරතුරු දිව්‍යමය නෘත්‍ය ගීතයෙන් ගීතවත් විය. නින්දට යද්දීත් අවදි වෙද්දීත් සැටදහසක් තූර්‍ය භාණ්ඩ නාද විය.

23. **හත්ථියානං අස්සයානං සිවිකං සන්දමානිකං,**
**සබ්බනතං පටිලාභාමි කඨිනදනස්සිදං ඵලං.**

හස්ති යානා, අශ්ව යානා, සිවිකා යානා ආදි සියළු යානයෝ ලැබීමි. මේ කඨින චීවර දානයේ ඵලයයි.

24. **රුක්ඛග්ගෙ පබ්බතග්ගෙ වා අන්තලික්ඛෙ ච භූමියං,**
**යද ඉච්ඡාමි දුස්සෙහි සබ්බං පටිලභාමහං,**

ගස් මුදුනකදී, පර්වත මුදුනකදී හෝ අහසෙහි, භූමියෙහි හෝ යම් තැනකදී වස්ත්‍ර කැමති වීම්ද ඒ සියල්ල කැමති අයුරින් ලබමි.

25. **චක්කවාළමුපාදය මහිං සාගරකුණ්ඩලං,**
**බොමදුස්සෙහි ඡාදෙමි කඨිනදනස්සිදං ඵලං.**



සක්වල ගලින් මෙපිට සතර මහා සාගරයෙන් වට වූ මුළු පොලොවම කොමු පිළියෙන් වසන්නට තරම් ආනුභාව ඇත්තෙමි. මේ කඨින චීවර දානයේ ඵලයයි.

26. **බුද්ධපච්චෙකබුද්ධානං සාවකානඤ්ච සබ්බසො,**
**එතදග්ගං දනඵලං සම්බුද්ධෙහිච වණ්ණිතං.**

බුද්ධ, පච්චේක බුද්ධ, ශ්‍රාවකයන් අතර දාන ඵලයන් ගෙන් මෙම කඨින දාන ඵලය අග්‍රය. එය බුදුරදුන් විසින්ද වර්ණනා කරන ලදී.

27. **යස්මා ආපත්ති නාසෙති භික්ඛූනං සික්ඛකාමිනං,**
**තස්මා හි සබ්බදනානං වුච්චතෙ කඨිනංවරං.**

ශික්ෂාකාමී භික්ෂූන් වහන්සේලාගේ ආපත්ති දුරු කිරීමට යම් කඨින චීවරයක් සමත් වේද, එහෙයින් එම කඨින චීවර පූජාව උතුම් යයි කියනු ලැබේ.

28. **බුද්ධපච්චෙකබුද්ධා ච සාවකාචාපි සබ්බසො,**
**එතෙන අග්ගදනෙන පත්තා තෙ උත්තමං වරං.**

බුද්ධ පච්චේක බුද්ධ ශ්‍රාවක යන සියළු දෙනා වහන්සේ මෙම අග්‍ර දානය නිසා උත්තම භාවයට පැමිණි සේක.

29. **තස්මා හි පණ්ඩිතො පොසො සඞ්ඝස්ස අත්ථමත්තනො,**
**පරිත්තදනං දත්වාන ලභන්ති තිවිධං සුඛං.**

එහෙයින් නුවණැති පුරුෂයා සංඝයා වෙත අල්ප වූ දානයක් දී තමන් ( දිව්‍ය, මනුෂ්‍ය, නිවන් යන) ත්‍රිවිධ සැපයම ලබන්නේය."